# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,981 - 2016 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2016.08.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 832 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | |
| —රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | 835 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 840 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - සිසිර ජයකොඩි සියපත පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජුනි මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් *භාරගැනීම ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 සැප්තැම්බර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අගෝස්තු මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**බී. කේ. එස්. රවීන්ද්‍ර**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2016 ජුනි මස 21 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


831 – B 081089 —403 (2016/08)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2016 අංක 797

MOD/DEF/2/01/ENL/11/DR.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක්

පහත නම සඳහන් මහත්මිය 2015 ජූලි මස 02 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බළසේනාවේ ලුතිනන් කර්නල් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුද වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

නූර් රිෆායා ජසිල්

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 573

---

2016 අංක 798

MOD/DEF/2/01/ENL/11/DR.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක්

පහත නම සඳහන් මහත්මා 2015 අගෝස්තු මස 04 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බළසේනාවේ ලුතිනන් කර්නල් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුද වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සමිත හිරණ්‍ය එගොඩගේ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 572

---

2016 අංක 799

MOD/DEF/2/01/ENL/07/DOCT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක්

පහත නම සඳහන් මහත්මිය 2015 අගෝස්තු මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බළසේනාවේ ලුතිනන් කර්නල් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට බලපැවැත්වෙන සේ, ශ්‍රී ලංකා යුද්ධ හමුද වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

නානායක්කාර හප්පාවන විතානගේ නිලුක්ෂි මනීෂා පෙරේරා

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 574

---

2016 අංක 800

D 960/KDU.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීමක්

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරි 2012 සැප්තැම්බර් මස 23 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය බළ හමුදාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/58741 කෙඩෙට් නිලධාරි කළණ හක්මණ විජේසිංහ

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 575

2016 අංක 801

MOD/DEF/2/01/ENL/09/UNI.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරිණිය 2014 ඔක්තෝබර් මස 21 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය බල හමුදවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුද වෛද්‍ය බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/58562 කාන්තා කෙඩෙට් නිලධාරි ෂෙරින් දිල්රුක්ෂි නානායක්කාර

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 577

2016 අංක 802

MOD/DEF/2/01/ENL/13/NDT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරින් 2015 අප්‍රේල් මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය බළසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට බලපැවැත්වෙන සේ ශ්‍රී ලංකා සංඥා බලකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට, අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/58624 කෙඩෙට් නිලධාරි අම්බලන්ගොඩ ගුරුන්නාන්සේලාගේ තිළිණ දනංජය පෙරේරා
සී/58635 කෙඩෙට් නිලධාරි මැටිවල ප්‍රතාප් මහේන්ද්‍ර
සී/58627 කෙඩෙට් නිලධාරි අඹගල පතිරන්නැහෙලාගේ ඉන්දික සුරේෂ් දිනුක

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 578

2016 අංක 803

MOD/DEF/2/01/ENL/01/CDT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්ථිර බල හමුදව**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත්කිරීම්

1. පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරින් 2015 දෙසැම්බර් මස 20 වැනි දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙළ අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ නිත්‍ය බළසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත්කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් යටතේ දක්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපතිතුමන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/59241 කෙනි ජයලත් පේඩිගේ බුද්ධි ශානක ගයාෂාන් ජයලත්, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව
සී/59248 කෙනි ඉඹුල්ගොඩ ගමගේ සහන් බිනුක ගමගේ, ශ්‍රී ලංකා සංඥා බළකාය
සී/59220 කෙනි තොටබඳුගේ තරින්ද ශෂිකුමාර ප්‍රනාන්දු, විජයබාහු පාබල රෙජිමෙන්තුව
සී/59242 කෙනි පළවින්නගේ සංජය හසාන් මුතුකුමාරණ, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය
සී/59156 කෙනි මහකුමාරගේ ලක්ෂිත ප්‍රියංග, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/59229 කෙනි වීරසිංහ වඩුගේ ඉන්දික සම්පත් වීරසිංහ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදව
සී/59244 කෙනි යාපා මුදියන්සේලාගේ දිනුෂ්ක විරාජ් කුමාර යාපා, ශ්‍රී ලංකා යුධ හමුද සේවා බලකාය
සී/59224 කෙනි මාස ආරච්චිගේ කණිෂ්ක මධුරංග වික්‍රමසිංහ, ගැමුණු හේවා බලකාය
සී/59226 කෙනි හිටිහාමුලාගේ ගෙදර ලසික ප්‍රසාද් ජයසේකර, ශ්‍රී ලංකා ඉංජිනේරු
සී/59173 කෙනි අසේල රවිත විජේරත්න, ශ්‍රී ලංකා පාබල හමුදව
සී/59239 කෙනි තරිඳු චතුරංග සේරසිංහ, ගැමුණු හේවා බලකාය
සී/59194 කෙනි ඩස්කන් මධුසංක විජේසිංහ. ශ්‍රී ලංකා යුද්ධ හමුද යුධෝපකරණ බලකාය
සී/59219 කෙනි ගොඩයලාගේ මනෝජ් ලහිරු කුමාර ජයතිස්ස, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/59215 කෙනි බටුවිටගේ සාලුක චතුරංග බටුවිට, ගැමුණු හේවා බලකාය
සී/59255 කෙනි හේවා දේවගේ චමිල ෂෙහාන් තේජන රූපසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුද පොලිස් හේවා බලකාය
සී/59223 කෙනි මුණවීර ආරච්චිගේ දමිත් ලක්මාල් මුණවීර, ශ්‍රී ලංකා පාබල හමුදව
සී/59217 කෙනි කළුබෝවිල අප්පුහාමිලාගේ වාසනා සඳරුවන් කළුබෝවිලගේ, ශ්‍රී ලංකා පාබල හමුදව
සී/59246 කෙනි හේනේගම ගමගේ සජිත් මධුසංඛ ගමගේ, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/59245 කෙනි ලියනගේ ඩිල්ශාන් සජිත් වීරසිංහ, ගජබා රෙජිමේන්තුව
සී/59181 කෙනි විකුම් ලංකා අබේවීර, ශ්‍රී ලංකා යුද්ධ හමුද පොදුසේවා බලකාය
සී/59253 කෙනි සන්ද දේවයලාගේ සිසිර කුමාර රූපසිංහ, ගජබා රෙජිමේන්තුව

සී/59216 කෙනි කරුණාධිපති වාසල හේරත් මුදියන්සේ රාළහාමිලාගේ උඩහ වලව්වේ අමෝදිත බණ්ඩාර ඇල්කඩුව, ගජබා රෙජිමේන්තුව
සී/59222 කෙනි හේරත් මුදියන්සේලාගේ කුෂාන් ප්‍රසන්න හේරත්, ශ්‍රී ලංකා සන්නිවේදන සන්නද්ධ බලකාය
සී/59234 කෙනි පාදුක්කගේ නාමල් පෙරේරා, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/59212 කෙනි මල්ලව ආරච්චිගේ දෙන් හෂාන් චන්දිමාල් මල්ලවආරච්චි, ශ්‍රී ලංකා යුද්ධ හමුද යුධෝපකරණ බලකාය
සී/59030 කෙනි දොන් ක්‍රිස්ටෝපර් හර්ෂාන් අමරසිංහ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදව
සී/59240 කෙනි ලොකුබදු වීරසූරිය පටබැඳිගේ යොහාන් මධුශංක වීරසූරිය, ගැමුණු හේවා බලකා
සී/59208 කෙනි හේරත් රාජපක්ෂවාදී වාසල බණ්ඩාරනායක මුදියන්සේ රාළහාමිලාගේ තැන්නේ පහළ වලව්වේ ධාරත ප්‍රියභාෂිත බණ්ඩාර තැන්නේ, ගජබා රෙජිමේන්තුව
සී59228 කෙනි ලියනගේ ජීවක චතුරංග අමරසිංහ, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/59178 කෙනි කොලොම්බුගමගේ මැදවත්තේ ලකිත් පන්ඩුක රත්නායක, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/59210 කෙනි ප්‍රබෝද් එරන්ද හේරත්, ශ්‍රී ලංකා පාබල හමුදව
සී/59189 කෙනි දක්ෂින චන්ද්‍ර සිරිවර්ධන, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදව

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජූලි මස 26 වැනි දින,
කොළඹ දී ය.

08 - 576

---

2016 අංක 804

MOD/DEF/07/01/AVF/CLE.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදව - ස්වේච්ඡා බළසේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද බළලත් නිලධාරීන් අධිකාරියට පත්කිරීම හා ඇතුළත් කිරීම

### අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම් සඳහන් බළලත් නිලධාරීන් 2015 ජුනි 12 වන දින සිට දක්වා ඇති ජොෂ්ඨතා පිළිවෙලට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුද ස්වේච්ඡා බළසේනාවේ ලුතිනන් (උපකරණ පාලක - පොදු රාජකාරී) නිළයෙන් අධිකාරියට පත්කිරීම හා එදිනම සිට දක්වා ඇති රෙජිමේන්තු/ බලකා වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

බළලත් නිලධාරී I බමුණු මුදියන්සේලාගේ එදිරිසිංහ - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
බළලත් නිලධාරී I අබේකෝන් මුදියන්සේලාගේ ගාමිණී ප්‍රියන්ත විජේනායක - ගජබා රෙජිමේන්තුව
බළලත් නිලධාරී I කෝනාර මුදියන්සේලාගේ චන්ද්‍රපාල - ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව
බළලත් නිලධාරී I කලුඅප්පු හත්වැදිගේ පියල් ධම්මික කරුණාරත්න - ශ්‍රී ලංකා යුද්ධ හමුද පොදු සේවා බළකාය
බළලත් නිලධාරී I කන්දේගෙදර මනන්නලාගේ චූලමන් කුසුම් කුමාර - ශ්‍රී ලංකා පාබල හමුදව
බළලත් නිලධාරී I අරඹේ ගෙදර ගාමිණී රත්නායක - විජයබාහු පාබල රෙජිමේන්තුව
බළලත් නිලධාරී I මුණසිංහ ආරච්චිලාගේ ධනුෂ්ක නුවන් ජයසේන - විජයබාහු පාබල රෙජිමේන්තුව
බළලත් නිලධාරී I බෙරකාර ගෙදර විමලසිරි - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
බළලත් නිලධාරී I දිසානායක මුදියන්සේලාගේ තිලක් දිසානායක - විජයබාහු පාබල රෙජිමේන්තුව
බළලත් නිලධාරී I රංගේ සිරිනිමල් - ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව
බළලත් නිලධාරී I අමුගොඩ කන්කානම්ගේ සුනිල් ගාමිණී - ශ්‍රී ලංකා යුද්ධ හමුද සේවා බළකාය
බළලත් නිලධාරී I කස්තුරි ආරච්චිලාගේ තිලක බණ්ඩාර - විජයබාහු පාබල රෙජිමේන්තුව
බළලත් නිලධාරී I කපුගේ දෙන් ටැනිසන් සිරිල් රණසිංහ - ගැමුණු හේවා බළකාය

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 ජුනි මස 17 වැනි දින,
කොළඹ දී ය.

08 - 475

# රජයේ නිවේදන

මගේ අංකය : ආර්ජී/එන්බී/11/02/03/2015/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2016.08.19 වැනි දින සිට 2016.09.02 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2016.09.09 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 2938 වෙළුමේ 181 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ ගල්කිස්ස පිහිටි 'කොපල්ස්ටන්' නැමැති ඉඩමට බලයලත් මානක එස්. සත්‍යපාලන් මහතා විසින් 1975.05.23 වැනි දින මැන සාදන ලද අංක 593 දරන පිඹුරේ ලොට් 5ජ් සඳහා මායිම්,<br><br>උතුරට : අඩි 30 පළල පාරට වෙන්කළ ලොට් 13 සිතියම් අංක 1520,<br>නැගෙනහිරට : ලොට් 7,<br>දකුණට : ලොට් ජී 2 සහ, ජී 3- 1463/22, 1974.08.22,<br>බස්නාහිරට : ද සේරම් පාර<br><br>ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 19.2. | 01. ජී. ඒකනායක ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1994.03.28 වැනි දින අංක 1294 දරන උකස්කරය නිදහස් කිරීම.<br><br>02. බී. ඩී. ටී. ධර්මතිලක ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන 2001.07.13 වැනි දින අංක 214 දරන උකස්කරය නිදහස් කිරීම.<br><br>03. කේ. එන් පී. පෙරේරා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2006.03.10 වැනි දින අංක 594 දරන උකස්කරය.<br><br>04. ජේ. ආර්. ගමගේ ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2009.01.15 වැනි දින අංක 3924 දරන උකස්කරය. |

08 - 449

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/18/2016/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වන තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2016.08.19 වැනි දින සිට 2016.09.02 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2016.09.09 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

#### උපලේඛනය

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ 1130 වෙළුමේ 04 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ මහරගම පිහිටි 'උ^රඩ ඕවිට' නමැති ඉඩමට බලයලත් මානක එන්. ඩබ්. මාකලන්ද මහතා විසින් 1975.02.14 වැනි දින මැන සාදන ලද අංක 1168 දරන පිඹුරේ ලොට් 1 සඳහා මායිම්,<br><br>උතුරට : එන්. ඩබ්. පෙරේරා සහ එන්. කිව් පෙරේරාගේ ඉඩම,<br>නැගෙනහිරට : එන්. චාර්ලිස් පෙරේරාගේ ඉඩම සහ ඩැනියල්ගේ ඕවිට,<br>දකුණට : සාංසික කුඹුර,<br>බටහිරට : ඊ. ඩී. මාලනීගේ ඉඩම සහ ඩැනියෙල්ගේ ඕවිට.<br><br>ප්‍රමාණය : අ. 0, රූ. 1, පර්. 05.5 | 01. එම්. ඩී. සී. සේනාරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1976.02.09 වැනි දින අංක 4322 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. යූ. විජේරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 2007.06.02 වැනි දින අංක 2544 දරන තෑගි ඔප්පුව. |

08 - 450

එප් 2 (2/64).

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1482 | 2016.06.10 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය ගිනිගත්හේන. | අංක 9/49, බණ්ඩාරනායක මාවත, ගිනිගත්හේන. | ගරු සිවනු කාලිමුත්තු කුමාර් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) ක්‍රිස්තියානි |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08 - 493/1

---

සහතික අංකය : 1482.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1482

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| විස්තර | පිහිටීම | | දිස්ත්‍රික්කය | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| | ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය | පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය ගිනිගත්හේන. | අංක 9/49,, බණ්ඩාරනායක මාවත, ගිනිගත්හේන. | අඹගමුව | නුවරඑළිය | ගරු සිවනු කාලිමුත්තු කුමාර් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත). |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2016ක් වූ ජූලි මස 27 වැනි දින,
බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

08 - 493/2

(එජ් 2) 2/64.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥ පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1481 | 2016.06.10 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය සාමිමලේ. (අප්කොට්) | නිශ්ශංක උයන, ගවරවිල, කොළනිය, මස්කෙළිය වීදිය, අප්කොට්. | ගරු එස්. ප්‍රැන්සිස් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08 - 494/1

---

(එජ් 2) 2/64.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1481

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| විස්තර | පිහිටීම | | දිස්ත්‍රික්කය | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| | ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය | පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය සාමිමලේ. අප්කොට් | නිශ්ශංක උයන, ගවරවිල කොළනිය, මස්කෙළිය වීදිය, අප්කොට්. | අඹගමුව | නුවරඑළිය | ගරු එස්. ප්‍රැන්සිස් පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2016ක් වූ ජූලි මස 27 වැනි දින,
බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

08 - 494/2

(එප් 2) 2/64.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදුකිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධි විධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1480 | 2016.06.10 | එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය, නොටන් බ්‍රිජ්. | නෝටන් බ්‍රිජ්. | ගරු මනෝහරන් ප්‍රභු පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ සංස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 ජූලි මස 27 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

08 - 495/1

---

(එප් 2) 2/64.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ගොඩනැගිල්ල ලියාපදිංචි කිරීමේ සහතිකය

සහතික අංකය : 1480

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තිය යටතේ කරන ලද ඉල්ලීම ප්‍රකාශය අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත විස්තර කරනු ලබන ගොඩනැගිල්ල, විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව සහතික කරමි.

| විස්තර | පිහිටීම | | දිස්ත්‍රික්කය | දේවගැති තැන අයිතිකරු හෝ භාරකරු | ගොඩනැගිල්ල ලියා පදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| | ගම හෝ වීථිය සහ නගර කොට්ඨාසය | පත්තුව, කෝරළය හෝ දිස්ත්‍රික්කයේ වෙනත් කොට්ඨාසය | | | |
| එසෙම්බ්ලි ඔෆ් ගෝඩ් දේවස්ථානය, නෝටන් බ්‍රිජ්. | නෝටන් බ්‍රිජ්. | අඹගමුව | නුවරඑළිය | ගරු මනෝහරන් ප්‍රභු පියතුමා | එසෙම්බ්ලීස් ඔෆ් ගෝඩ් ඔෆ් සිලෝන් (1947 අංක 53 දරන පාර්ලිමේන්තු පනතේ ස්ථාපිත) |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

වර්ෂ 2016ක් වූ ජූලි මස 27 වැනි දින,
බත්තරමුල්ලේ දී මගේ අත්සන තබන ලදී.

08 - 495/2

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ( ලියාපදිංචි අංකය පී.කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංක : 1904650.
උමගිලිය විතානගේ ජගත් වසන්ත රාජකරුණා.

2016 අප්‍රේල් මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

මොරවක ප්‍රසිද්ධ නොතාරිස් D.D. අබේවික්‍රම විසින් 2010 අප්‍රේල් මස 06 වැනි දින සහතික කරන ලද අංක 1409, 2011 ඔක්තෝබර් මස 24 වැනි දින සහතික කළ අංක 2046 සහ 2012 මාර්තු මස 08 වැනි දින සහතික කළ අංක 2206 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි නමට ලියන ලද්ද වූ බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම උමගිලිය විතානගේ ජගත් වසන්ත රජකරුණා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් එක්කෝටි තුන්ලක්ෂ විසිහතරදහස් පන්සිය දෙළහයි ශත හැටතුන (රු. 10,324,512.63) ක මුදලක් 2016 මාර්තු මස 03 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් එක්කෝටි තුන්ලක්ෂ විසිහතරදහස් පන්සිය දෙළහයි ශත හැටතුන (රු. 10,324,512.63) ක මුදල අය කර ගැනීම සඳහා සහ 2016 මාර්තු මස 04 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රු. 9,687,335.97 ක මුදල මත 11% ක වැඩිදුර පොලියක් සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවාද අඩුකොට එකී අංක 1409, 2046 සහ 2206 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපල සහ පරිශ්‍ර කොළඹ 12 හල්ස්ඩෝර්ෆ් වීදියේ 2 වන මහලේ අංක 200 දරන ස්ථානයේ පිහිටි ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවන් හි අනුඥලත් වෙන්දේසිකරු එල්.බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අය කර ගැනීමේ ( විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ තෙල්අඹුර ගමේ හි පිහිටි හත්හවුල්හේන සහ පිංකුඹුර ගොඩකන්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු T. අඹවත්ත විසින් 1995 ජනවාරි මස 07 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 13 වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : දෙණියවත්ත සහ හික්ගහවත්ත ද, නැගෙනහිරට : අකුරැස්සවත්ත ගෝනකොළදෙණිය සහ ගෝනකොළදෙණියේ දෙළ ද, දකුණට : පිංකුඹුර දෙළ සහ පිංකුඹුර කන්ද ද සහ බස්නාහිරට: ගොබ්බලගෙ ාඩ, උළහේනේවත්ත සහ කුතුඩුමුල්ල කන්දෙන්ද මායිම් වූ අක්කර දහඅටයි පර්චස් තිහ (අ. 18, රූ. 0, පර්. 30) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වන මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව D 703/326 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම වඩා මෑතකදී කරන ලද නැවත මැනීමකින් පසු පහත සඳහන් පරිදි සවිස්තර විස්තර කෙරේ.

ඉහත සඳහන් තෙල්අඹුර ගමේ හි පිහිටි හත්හවුල්හේන සහ පිංකුඹුර ගොඩකන්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු K.V.P.B. කීර්තිලාල් විසින් 2010 පෙබරවාරි මස 06 වැනි දින මැන සාදන ලද අංක 230 දරන පිඹුරේ ලොට් A වශයෙන් දක්වෙන ඉඩමට මායිම් වශයෙන් උතුරට : දෙණියවත්ත සහ හික්ගහවත්තද, නැගෙනහිරට : අකුරැස්සවත්ත ගෝනකොළදෙණිය සහ ගෝනකොළදෙණිය දෙළ ද, දකුණට : පිංකුඹුර දෙළ සහ පිංකුඹුර කන්ද ද සහ බස්නාහිරට : ගොබ්බල්ගොඩ, උලහේනේවත්ත සහ කුතුඩුමුල්ල කන්දෙන්ද මායිම් වූ එකී අංක 230 දරන පිඹුරු ප්‍රකාරව අක්කර දහඅටයි පර්චස් තිහ (අ. 18, රූ. 0, පර්. 30) ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි ගසකොළ වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමඟ වේ.

රංජනී ගමගේ මිය,
සමාගම් ලේකම්.

2016 මැයි මස 11 වැනි දින,

08-529

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

නොච්චියාගම, මුදිතාගම, අංක 208 හි පදිංචි දිල්ෂාන් චතුරංග සමරසිංහ මයා සහ මාලනි ගජසිංහ ගමගේ *හෙවත්* මාලනී ගජසිංහ *හෙවත්* ගජසිංහ ගමගේ මාලනී මිය යන අයගේ ණය වගකීම් සඳහා උකස් කරන ලද නොච්චියාගම, මුදිතාගම, අංක 208 හි පිහිටි දේපල විකිණීම.

2016 ජූනි මස 22 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් ඩී. යූ. මනෝදරා විසින් සහතික කරන ලද 2013.01.07 වැනි දිනැති අංක 957 දරන උකස් බැඳුම්කර සහ 2012.10.08 වැනි දිනැති අංක 899 දරන උකස් බැඳුම්කර අනුව 2016.01.05 වැනි දින තෙක් අයිරාව මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් විසිපන් ලක්ෂ පනස් දහස් නවසිය අසූහයයි ශත තිහක (රු. 25,50,986.30) මුදල සමඟ රුපියල් ලක්ෂ විස්සක (රු. 20,00,000.00) මුදල මත වසරකට සියයට දහහතර (14%) බැගින් 2016.01.06 වැනි දින සිට තවදුරටත්

පොලියක්ද ණය මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් තිස්එක්ලක්ෂ අසූතුන් දහස් අටසිය හැට තුනයි ශත පනස් හතක (රු. 31,83,863.57) මුදල සමඟ රුපියල් විසිහතර ලක්ෂ පනස් හත් දහස් නවසිය අසූ නවයයි ශත හතලිස් හයක (රු. 24,57,989.46) මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොලියක් 2016.01.06 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ඩිල්ෂාන් චතුරංග සමරසිංහ මයා සහ මාලනී ගජසිංහ ගමගේ *හෙවත්* මාලනී ගජසිංහ *හෙවත්* ගජසිංහ ගමගේ මාලනී මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2013.01.07 වැනි දිනැති අංක 957 දරන උකස් බැඳුම්කරය සහ 2012.10.08 වැනි දිනැති අංක 899 දරන උකස් බැඳුම්කර අනුව අයිරාව මත අයවිය යුතු රුපියල් විසිපන් ලක්ෂ පනස් දහස් නවසිය අසූහයයි ශත තිහක (රු. 25,50,986.30) මුදල සමඟ ණය මත රුපියල් තිස්එක්ලක්ෂ අසූතුන් දහස් අටසිය හැට තුනයි ශත පනස් හතක (රු. 31,83,863.57) මුදල සමඟ 2015.01.06 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම ආයතනය හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 26 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, නොච්චියාගම ශාඛාවේ කළමණාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, විලච්චිය කෝරළේ අංක 337 දරන මුදිතාගම ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ හිරියාලේගම ග්‍රාමයේ පිහිටි '' ස්ටේට් ලෑන්ඩ්'' නැමති ඉඩම් කැබැල්ල උතුරට ගම්සභා පාරට වෙන් කළ කොටස ද, නැගෙනහිරට : ලොට් අංක 19 ද, දකුණට : පුත්තලම පාරට වෙන් කළ කොටස ද, බස්නාහිරටː ජී. වී. පිනාට අයත් ඉඩම ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් දහසයක (අ. 0, රූ. 2, පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත් වේ. මෙය අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O 212/30 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. ඩබ්. රත්නසිරි විසින් මෑතකදී කරන ලද මැනීමකට අනුව පහත ආකාරයට විස්තර කොට ඇත.

එකී හිරියාලේගම පිහිටියාවූ බලයලත් මිනින්දෝරු ඒ. එම්. බී. රත්නසිරි විසින් සාදන ලද 2012.09.04 වැනි දිනැති අංක 5578 දරන පිඹුරෙහි ලොට් අංක 1 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 1 උතුරට : මෙම පිඹුරෙහි ලොට් 2 (අතිරික්ත වගාව) ද, නැගෙනහිරට : ලොට් අංක 19 (එස්. කුමාරසිංහට අයත් ඉඩම) ද, දකුණට : පාර (RDA) දිගට ඇති පාරට වෙන් කළ කොටස ද, බස්නාහිරට : ජී. වී. පිනාට අයිති ඉඩමද මායිම්ව රූඩ් දෙකයි පර්චස් දහසයක් (අ. 0, රූ. 2, පර්. 16) *හෙවත්* හෙක්ටයාර බිංදුවයි දශම දෙකයි හතරයි දෙකයි අටක (හෙක්ටයාර 0.2428) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. එස්. අයි. ගුණරත්න,
කළමනාකරු.

ලංකා බැංකුව,
නොච්චියාගම.

08 - 532

---

### පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - කොල්ලුපිටිය ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීමයි

ගනුදෙනුකරුගේ නම : ඔනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2016.06.27 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගන්නා ලදී.

එනම්, ඔනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ්, බන්ධනදයි, වශයෙන් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. විමලසේකර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2012.10.30 වැනි දිනැති අංක 8136 දරන උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී අංක 8136 දරන උගස් බැඳුම්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2016.06.13 වැනි දින දක්වා මුල් මුදල සහ පොළිය ද, වශයෙන් රුපියල් නව මිලියන අසූ අට දහස් තිස් හතයි ශත විසි නවය (රු. 90,88,037.29) ක මුදල සහ 2016.06.14 වැනි දින සිට රුපියල් නව මිලියන හැත්තෑ හත් දහස් හාරසිය තිස් හයයි ශත විසි එක (රු.90,77,436.21) ක මුදල මත වාර්ෂිකව 12% ක අවම පොලී අනුපාතයක් සමග මාසිකව AWPLR + 3% බැගින් පොළියද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී

(මෙහි මින්මතු, බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේද යත්,

එකී අංක 8136 දරන උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් නව මිලියන අසූ අට දහස් තිස් හතයි ශත විසි නවය (රු.90,88,037.29) ක මුදල ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද ගාස්තු ද අංක වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ඔනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් බැංකුව වෙත උකස්කර ඇති දේපල, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවත, අංක 182/3 (50/3) දරන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න වෙත එකී වර්ෂ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කොරළේ, දූනගහ පත්තුවේ, මීගමුව මහ නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව ඇතුලත පලඟතුරෙයි ග්‍රාම නිලධාරී කොට්ඨාස අංක 75 ඒ හි, පලඟතුරෙයි බටහිර පිහිටා ඇති පෝරුතොට පාරේ වරිපනම් අංක 351 දරන පයරුගහවත්ත සහ දෙඹගහවත්ත යනුවෙන් නම්කර හඳුන්වනු ලබන, බලයලත් මානක, ඩබ්. එස්. එස්. මෙන්ඩිස් විසින් සකසන ලද අංක 4127/ඒ සහ 2008 පෙබරවාරි මස 08 වැනි දිනැති පිඹුරෙහි දක්වා ඇති බෙදු වෙන්කරන ලද ලොට් 1 දරන ඉඩම් කොටස වන, එකී ලොට් 1 ට මායිම්, උතුරට : පාර ද(මහ නගර සභා), නැගෙනහිරට : පාර (ම.න.ස.) සහ පිඹුරු අංක 93/17 හි ලොට් 3 ද, දකුණට : පිඹුරු අංක 93/17 හි ලොට් 3 සහ ඩබ්. පී. පී. ෆ්‍රැන්ක් පෙරේරාගේ ඉඩම සහ බස්නාහිරට : පෝරුතොට පාරද පිහිටා ඇති ඉහත කියන ලද අංක 4127/ඒ දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දෙළහයි දශම දෙක (අ. 1, රූ. 3, පර්. 12.2) ක් බෙදු වෙන් කරන ලද ඉඩම් කොටස සමග ඒ මතවූ ගහකොළ, වැවිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වන අතර, මෙය මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ වෙළුම පත්‍රිරු ඊ 1030/48 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මානක, එම්. ඩී. එඩ්වඩ් විසින් සකසන ලද අංක 194 දරන 1992 පෙබරවාරි මස 12 වැනි දිනැති පිඹුරේ ලොට් 12 (පාරට වෙන්කිරීම) මතින් සහ එය ඔස්සේවූ මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

උදිතා කොඩිකාර,
කළමණාකාරිණී - ණය අයකර ගැනීම්.

08-537

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන)
පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑප්සීසී බැන්ක් (පීඑල්සී) විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑප්සීසී බැන්ක් (පීඑල්සී) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2016 ජූනි මස 01 වැනි දිනදී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑප්සීසී වර්ධන බැන්ක් පීඑල්සී සමාගමේ අනුප්‍රාප්තික ඩීඑප්සීසී බැන්ක් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ.ඩී.ඒ.වී.විජේකෝන් විසින් ලියා සහතික කරන ලද අංක 793 හා 2014 පෙබරවාරි මස 17 වැනි දින දරන උකස් බැඳුම්කරය මත සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. එන්. ඩී. ආර්. සමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 85 හා 2014 නොවැම්බර් මස 20 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම්, සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි අංක පීවී 74280 දරන්නාවූ සහ ලියාපදිංචි කාර්යාලය ගම්පහ පිහිටා ඇත්තාවූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට ''එකී සමාගම'' යනුවෙන් සඳහන් කරනු ලබන) ''සිල්ක් රෝඩ් ඉම්පෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්'' සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2015 දෙසැම්බර් මස 31 වැනි දිනට එකී '' සිල්ක් රෝඩ් ඉම්පෝටර්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඉහත කී අංක 793 හා 85 දරන උකස් බැඳුම්කර මත ඩීඑප්සීසී බැන්ක් පීඑල්සී වෙත රුපියල් අනූ දෙලක්ෂ හාර දහස් පන්සිය හයකුත් ශත අසූ අටක (රු. 92,04,506.88) මුදලක් සහ ඒ සමග 2016 ජනවාරි මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අසූපන් ලක්ෂ පනස් තුන් දහස් එකසිය විසිඅටක (රු. 85,53,128) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකටම වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ තත්කාලීන මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) SPOT වර්ෂයකට සියයට හතක් (7.0%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අනූ දෙලක්ෂ හාර දහස් පන්සිය හයකුත් ශත අසූ අටක (රු.92,04,506.88) මුදලක් සහ ඒ සමග 2016 ජනවාරි මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අසූපන් ලක්ෂ පනස් තුන් දහස් එකසිය විසිඅටක (රු. 85,53,128) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන

ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ තත්කාලීන මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (AWPR) SPOT වර්ෂයකට සියයට හතක් (7.0%) ඉහළ අනුපාතිකයක් මත ගණනය කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදළ ඉඩම ගොඩනැගිලි සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන)පනතේ 13 වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී සමාගම වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 793 සහ 85 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම, ගොඩනැගිලි, පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 793 සහ 85 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සහ ගම්පහ මහ නගර සභා සීමා ඇතුළත, අංක 224 A නැගෙනහිර ඉහළගම ග්‍රාම නිලධාරී වසමේ, ගම්පහ ඉහළගම පිහිටි, කැටකැලගහවත්ත *නොහොත්* මිල්ලගහවත්ත නමැති ඉඩමේ (බලයලත් මානක එම්.එස්. ප්‍රනාන්දු මැන සකස් කළ අංක 43/65 හා 1965 සැප්තැම්බර් මස 11 වැනි දින දරන පිඹුරේ ලොට් B දරන බිම් කට්ටිය නැවත මැනීමක් වූ) බලයලත් මානක යූ. එම්. ආරියසේන මැන සකස් කළ අංක 199 හා 1992 ජූනි මස 14 වැනි දින දරන පිඹුරේ නිරූපිත බෙද වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : අඩි 10 ක් පළල පාර සඳහා වෙන්කළ බිම ද, නැගෙනහිරට : කේ. කේ. වනිගසේකරගේ ඉඩම ද, දකුණට : විජේපාලට සහ තවත් අයට අයිති ඉඩම සහ බස්නාහිරට ඩී. පී. රාජපක්ෂගේ ඉඩම ද යන මායිම් ඇතුළත, ඉහත කී අංක 199 දරන පිඹුර ප්‍රකාර රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ, මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

වඩා මෑතකදී සිදුකරන ලද මැනීමකට අනුව ඉහත සඳහන් බිම් කට්ටිය පහත දක්වෙන පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සහ ගම්පහ මහ නගර සභා සීමා ඇතුළත, අංක 224 A නැගෙනහිර ඉහළගම ග්‍රාම නිලධාරී වසමේ, ගම්පහ ඉහළගම පිහිටි, කැටකැලගහවත්ත *නොහොත්* මිල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මානක එස්. ඩී. චන්ද්‍රසේකර මැන සකස් කළ අංක 8794 හා 2013 දෙසැම්බර් මස 15 වැනි දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙද වෙන්කළ බිම් කට්ටියට මායිම් උතුරට : පාර ද, නැගෙනහිරට : කේ. කේ. වනිගසේකරගේ ඉඩම ද, දකුණට : විජේපාලට සහ තවත් අයට අයිති ඉඩම ද, බස්නාහිරට : ඩී. පී. රාජපක්ෂට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත ඉහත කී අංක 8794 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිස් අටකුත් දශම දෙකයි පහක (අ.0, රූ. 0, ප. 38.25) ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

08 - 542

---

**ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් සම්මත කරගන්නා ලද යෝජනාව පිළිබඳ දැන්වීමයි

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනාව 2016 ජූනි මස 29 වැනි දින ඒකමතිකව සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව**

(කලින් ඩීඑෆ්සීසී බැංකුව යනුවෙන් හඳුන්වන ලද) ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී නමට අම්පාර ප්‍රසිද්ධ නොතාරිස් සසිකා නිරෝෂිණී සෙක්සස් ද සිල්වා විසින් ලියා සහතික කරන ලද 2014 මාර්තු මස 20 දිනැති අංක 489 හා 490 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම, "සේනකි පෙරසව් ටයර් ඉන්ඩස්ට්‍රීස්" හි හවුල්කරුවන් වන සමන්ප්‍රිය අමරසිංහ සහ අස්ගිරියගේ තිලක් සෙනෙවිරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2015 දෙසැම්බර් මස 31 වැනි දිනට එකී, "සේනකි පෙරසව් ටයර් ඉන්ඩස්ට්‍රීස්" හි හවුල්කරුවන් වන සමන්ප්‍රිය අමරසිංහ සහ අස්ගිරියගේ තිලක් සෙනෙවිරත්න යන අයගෙන් එකී අංක 489 සහ 490 යන උකස් බැඳුම්කර මත ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත රුපියල් පනස් හතර ලක්ෂ හතලිස් දහස් තුන්සිය හැත්තෑ පහයි ශත දහතුනක (රු. 54,40,375.13) මුදලක් ද, 2016 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හතලිස් පන් ලක්ෂ තිස් හත් දහස් තිස් පහක (රු. 45,37,035.00) මුදල මත සෑම මාසයකම ව්‍යාපාර කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ආසන්නතම

0.5%ට වටයනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලි අනුපාතිකය (AWPR) වාර්ෂික සියයට නවයක් (9.0%) බැගින් වූ අනුපාතයට අනුව පොලිය සහ රුපියල් දෙලක්ෂ අසූ හතර දහස් අටසිය අනූහයක (රු. 284,896.00) මුදල මත වාර්ෂික සියයට විසිහතරක් (24.0%) බැගින් වූ අනුපාතිකයට අනුව ද අයවිය යුතුව සහ ගෙවිය යුතුව ඇති බැවින් ද,

තව ද, එකී මුදල වන රුපියල් පනස් හතර ලක්ෂ හතලිස් දහස් තුන්සිය හැත්තෑ පහයි ශත දහ තුනක (රු. 5,440,375.13) මුදලක් ද, 2016 ජනවාරි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් හතලිස් පන් ලක්ෂ තිස් හත් දහස් තිස් පහක (රු. 4,537,035.00) මුදල මත සෑම මාසයකම ව්‍යාපාර කරන පළමුවන දිනයේ දී ප්‍රතිශෝධනය කරනු ලබන ආසන්නතම 0.5%ට වටයනු ලබන සාමාන්‍ය බර තැබූ මධ්‍ය මූලික ණය පොලි අනුපාතිකයට (AWPR) වාර්ෂික සියයට නවයක් (9.0%) බැගින්වූ අනුපාතයට අනුව පොලිය සහ රුපියල් දෙලක්ෂ අසූ හතර දහස් අටසිය අනූ හයක (රු. 284,896.00) මුදල මත වාර්ෂික සියයට විසි හතරක් (24.0%) බැගින් වූ අනුපාතයට අනුව පොලිය ද හෝ විකිණීමේ අවස්ථාව දක්වා එයින් නොගෙවා ඉතිරිවී ඇති යම් කොටසක් එකී පහත විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රයේ බදු අයිතිය 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියේ නියමයන් යටතේ ඉහත කී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති සමග අනුකූලව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී විසින් වැය කර ඇති සියලු මුදල් ද, ප්‍රචාරක ගාස්තු සහ අනෙකුත් අයකිරීම් ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 489 හා 490 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී වෙත උකස් කරන ලද පහත විස්තර කරන ලද ඉඩම සහ පරිශ්‍රය ද, ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් ලවා විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) ඔවුන් වෙත පැවරී ඇති බලතල අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා කරයි.

අංක 489 හා 490 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ, අම්පාර නගර සභා බලසීමාව තුළ සේනානයකපුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැවගම්පුර උතුර හි අම්පාර කලාප "එෆ්" ගමේ පිහිටි සර්වේ ජනරාල්වරයා විසින් සාදන ලද කැඩැස්ටල් සිතියම් අංක 280010 හි ලොට් 39 වශයෙන් ලකුණු කළ වරිපනම් අංක 42 දරන "බෝඩි ලෑන්ඩ්" නමැති ඉඩම් කොටසට මායිම් උතුරට : කැඩැස්ටල් සිතියම් අංක 280006 සහ ලොට් 40 ද, නැගෙනහිරට : ලොට් 40, 41 සහ මූලික පිඹුරු/අම්/1457 ද, දකුණට : ලොට් 34 සහ 38 ද සහ බස්නාහිරට : ලොට් 34, 37 සහ 38 ද වශයෙන් මායිම් වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0927 ක් විශාල ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද සමග වේ. මෙය අම්පාර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A06/61 හි ලියාපදිංචි වී ඇත.

එකී පිඹුරේ දැක්වෙන ඩී.එස්. සේනානායක මාවත ඔස්සේ හා මතින්වන මාර්ග අයිතිය ද සමග වේ.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

08 - 543

---

**ජාතික ඉතිරි කිරීමේ බැංකුව - ප්‍රධාන කාර්යාලය - ආයතනික මූල්‍ය අංශය**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ගනුදෙනුකරුගේ නම : ඔනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි ප්‍රයිවට් ලිමිටඩ්

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 ජූලි මස 21 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මෙහි පහත දක්වෙන පරිදි යෝජනා සම්මතය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලදී.

1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත යටතේ නිසි පරිදි සංස්ථාපිත ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට සහ ලියාපදිංචි අංක PQ 48 දරන පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී නමට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී.එම්. විමලසේකර විසින් ලියා සහතික කරන ලද අංක 8136 දරන 2012 ඔක්තෝබර් මස 30 වැනි දිනැති උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, එකී මුදල ගෙවීමට බැඳී සිටින්නා වූ ඔනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත 2016 ජුනි මස 13 වැනි දිනට මුල් මුදල හා පොලිය ලෙස රුපියල් විසිහය මිලියන හත්සිය හැට හතර දහස් හාරසිය අනූහතරයි ශත පනහක (රු. 26,764,494.50) මුදලක් සහ 2016 ජුනි මස 14 වැනි දින සිට ගෙවන දිනය දක්වා රුපියල් විසිහය මිලියන හත්සිය තිස් තුන්දහස් දෙසිය හැත්තෑහතරයි ශත හතක් (රු. 26,733,274.07) සඳහා 12% ක අවම වාර්ෂික පොළී අනුපාතිකයක් සමග බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ මාසික පොළී අනුපාතිකය (ශ්‍රී ලංකා මහ බැංකුවෙහි වෙබ් අඩවියෙහි ප්‍රකාශයට පත් කර ඇති බර තැබූ සාමාන්‍ය ප්‍රමුඛ ණයදීමේ පොළී අනුපාතිකය) + 3% ක වාර්ෂික පොළී අනුපාතිකය මත පොළියද ජාතික ඉතිරිකිරීමේ බැංකුවට (මෙහි මින් ඉදිරියට

''බැංකුව'' ලෙස හඳුන්වනු ලබන) ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අංක 8136 දරන උකස් බැඳුම්කරය මගින් ඔනර්ස් ක්ලබ් ඉන්ටර්නැෂනල් ඇකඩමි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් බැංකුව වෙත උකස් කරන ලද දේපළ, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 182/3 (50/3) හි බලයලත් වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා හට අවසරදීමට හා බලය පැවරීමට සහ එමගින් ඉහත කී රුපියල් විසිහය මිලියන හත්සිය හැට හතර දහස් හාරසිය අනූහතරයි ශත පනහක මුදල (රු. 2,67,64,494.50) සහ ඉහත කී දින සිට විකිණීමේ දිනය දක්වා ඉහත කී පොලිය ද ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒ මුදල් ද අඩුකිරීමෙන් අනතුරුව, පෙරකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකරගත හැකි පිරිවැය හා මුදල් ද සමග අයකර ගැනීම සඳහා මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 8136 දරන උකස් බැඳුම්කරය යටතේ ඉහත සඳහන් උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිසත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුව තුළ මීගමුව මහනගර සභා සීමාව හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සීමාව තුළ පලඟතුරෙයිහි 75 (A) දරන ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ පලඟතුරෙයි බටහිර පිහිටි පෝරුතොට පාරේ තක්සේරු අංක 351 දරන ''පයුරුගහවත්ත සහ දෙඹගහවත්ත'' යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. මෙන්ඩිස් විසින් මැන සාදන ලද 2008.02.08 වැනි දිනැති මිනින්දෝරු සැළසුම් අංක 4127/A දරන පිඹුරේ දැක්වෙන බෙදූ වෙන්කළ බිම් කට්ටිය වන, අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දොළහයි දශම දෙක (අ. 1, රූ. 3, පර්. 12.2) ක විශාලත්වයක් ඇති ලොට් අංක 1 නමැති ඉඩමට මායිම් උතුරට : පාර ද (මහ නගර සභා), නැගෙනහිරට : පාර (මහ නගර සභා) හා අංක 93/17 දරන පිඹුරේ ලොට් අංක 3 ද, දකුණට : අංක 93/17 දරන පිඹුරේ ලොට් අංක 3 හා ඩබ්. පී. පී. ෆ්‍රැන්ක් පෙරේරා යන අයගේ ඉඩම ද, බටහිරට : පෝරුතොට පාර ද, යන මායිම් ඇතුළත පිහිටි ඉඩම, ගස් හා වගාවන් සහ එහි පිහිටි සියලු දේ, මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 1030/48 වෙළුම /පිටුව (G 09/20 වෙත ගෙන යන ලද) යටතේ ලියාපදිංචි වී ඇත.

තව ද, මෙකී දේපළට ඇතුළුවීම සඳහා එම්. ඩී. එඩ්වඩ් බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 194 දරන 1992.02.12 වැනි දිනැති පිඹුරේ දැක්වෙන ලොට් අංක 12 හි මාර්ග අයිතිය ද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

ජේ. එම්. සෙනෙවිරත්න බණ්ඩා,
සහකාර සාමාන්‍යාධිකාරී - ණය අයකර ගැනීම්.

08 - 569

---

ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක. 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

හොරණ, කර්මාන්ත පුරය, අරමනගොල්ල, අංක 15 හි ඩී ඇන්ඩ් ඩී පොලිසැක්ස් හි වගකීම් වෙනුවෙන් හොරණ, කර්මාන්ත පුරය, අරමනගොල්ල, අංක 15 හි පිහිටි උකස් කරන ලද දේපළ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.06.22 වැනි දින පවත්වන ලද රැස්වීමේ දී විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජේ.සී.මහාරච්චි විසින් සහතික කරන ලද 2012.07.24 දිනැති අංක 99 දරන උකස් බැඳුම්කරය මත පිළිවෙළින් 2016.05.25 වැනි දින තෙක් හිඟහිටි මුල් මුදල සහ පොළිය වශයෙන් ණය පහසුකම් මාලාව සඳහා රුපියල් එක්කෝටි තුන් ලක්ෂ හැත්තෑ හත් දහස් අටසිය අනූ නවයයි ශත තිස් දෙක (රු. 10,377,899.32) සහ අයිරා පහසුකම සඳහා රුපියල් එක්කෝටි තිස්පත් ලක්ෂ හැත්තෑ හතර දහස් එකසිය විස්සයි ශත පනස් හතර (රු. 13,574,120.54) බැගින් මුළු මුදල වන රුපියල් දෙකෝටි තිස්නව ලක්ෂ පනස් දෙදහස් දහනවයයි ශත අසූ හය (රු. 23,952,019.86) සමඟ ඉහත කී ණය පහසුකම් මාලාවෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් පනස් නව ලක්ෂ අසූදාහ (රු. 5,980,000.00) මත වසරකට AWPLR + 7% බැගින් ද අයිරා පහසුකමෙහි හිඟහිටි මුල් මුදල වන රුපියල් එක්කෝටියක (රු. 10,000,000.00) මුදල මත වසරකට 13.32% බැගින් ද 2016.05.26 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් ගෙවිය යුතු පොළිය හොරණ, කර්මාන්ත පුරය, අරමනගොල්ල, අංක 15 හි ඩී ඇන්ඩ් ඩී පොලිසැක්ස් වෙතින් අයවිය යුතුව ඇත.

2. එකී අංක 99 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් දෙකෝටි තිස්නව ලක්ෂ පනස් දෙදහස් දහ නවයයි ශත අසූහයක (රු. 23,952,019.86) මුදල සමඟ 2016.05.26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට තවදුරටත් අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් වෙන්දේසිකාර මහතුන් හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥා පනතේ 21 වැනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, අයකර ගැනීම් - ආයතනික අංශයේ සම්බන්ධතා කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ ,කලුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 610A දරන අරමනගොල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රයිගම් කෝරලේ කුඹුකෙ පත්තුවේ අරමනගොල්ලහි පිහිටි ''ඇල්ලකන්ද එස්ටේට්'' නැමති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ඩී.අනුර ධර්මසිරි විසින් සාදන ලද

2010.01.31 වැනි දිනැති අංක 4516 දරන පිඹුරෙහි ලොට් 15 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල උතුරට : බලයලත් මිනින්දෝරු ඩී.එච්.ඇතුළත්මුදලි විසින් සාදන ලද 1978.06.22 වැනි දිනැති අංක 112 දරන පිඹුරෙහි ලොට් 13 ද, නැගෙනහිරට : එකී අංක 112 දරන පිඹුරෙහි ලොට් 16 ද, දකුණට : පාර දිගට ඇති පාරට වෙන් කළ කොටස ද, බස්නාහිරට : එකී අංක 112 දරන පිඹුරෙහි ලොට් 14 (පාර) ද මායිම්ව රූඩ් එකයි පර්චස් හයක (අ. 0, රූ. 1, පර්. 6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද වේ.

එකී බිම් කොටස පහත විස්තර කොට ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, හොරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ කලුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, කුඹුකේ පත්තුවේ අරමනගොල්ලහි පිහිටි ''ඇල්ලකන්ද එස්ටේට්'' නැමති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ඩී.එච්. ඇතුළත්මුදලි විසින් සාදන ලද 1978.06.22 දිනැති අංක 112 දරන පිඹුරෙහි ලොට් 15 ලෙස දක්වා නිරූපණය කර ඇති ඉඩම් කැබැල්ල උතුරට : ලොට් 13 ද, නැගෙනහිරට : ලොට් 16 ද, දකුණට : ගම්සභා පාරට වෙන් කළ කොටස ද, බස්නාහිරට : ලොට් 14 ද මායිම්ව රූඩ් එකයි පර්චස් බිංදුවයි දශම හයක (අ. 0, රූ. 1, පර්. 0.6) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 327/64 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී.ඒ.ජී. වීරකෝන් බණ්ඩා මයා,
සම්බන්ධතා කළමනාකරු.
(අයකර ගැනීම් - ආයතනික)

ලංකා බැංකුව,
අයකර ගැනීමේ ඒකකය,
අංක 01, ලංකා බැංකු මාවත,
කොළඹ 01.

08 - 597

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.